කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

ප්‍රථම වර්ෂ පරීක්ෂණය (බාහිර) - 2007

# BMGT E 1035 – ව්‍යාපාරික ආර්ථික විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

(01) (අ) ආර්ථික විශ්ලේෂණයෙහි එන ඉල්ලුම් මිල නම්‍යතා සංකල්පයෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ආ) 'Y' භාණ්ඩයේ මිල 20% කින් වැඩිවීමෙහි ප්‍රතිඵලයක් ලෙස 'X' භාණ්ඩයේ පාරිභෝජනය 8% කින් වැඩි වී ඇතැයි සිතන්න. මෙය ආදේශන ප්‍රතිවිපාකයට නිදසුනකි. මෙම ප්‍රකාශය සමග ඔබ එකගවන්නේද? හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඇ) (i) එක්තරා භාණ්ඩයකට අදාලව පහත තොරතුරු දක්වා ඇති අතර සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

P = 80 - Q (ඉල්ලුම)

P = 20 + Q (සැපයුම)

(ලකුණු 04)

(ii) සැපයුම්කරු එක් ඒකකයක් සඳහා රු. 6 ක බද්දක් ගෙවිය යුතු යැයි උපකල්පනය කරන්න. නව සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 20)

(02) (අ) ආන්තික උපයෝගීතාවය හා මුළු උපයෝගීතාවය යන සංකල්පයන් නිදසුන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) උපේක්ෂා වක්‍ර විග්‍රහය තුලින් පාරිභෝගික සමතුලිතය උපරිම වන ආකාරය ප්‍රස්ථාරිකව නිරූපණය කර පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය 'U' හැඩයෙන් යුක්ත වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ඈ) උපේක්ෂා වක්‍ර සහ අයවැය සංරෝධකයන් භාවිතයෙන් ආදායම් හා ආදේශන ප්‍රතිවිපාකයන් නිර්මාණය කර දක්වන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

(03) (අ) ගොවි මහතෙකු වූ ගුණදාස සතුව අක්කර 100 ක ඉඩමක් ඇති අතර ඔහු එහි එක් කම්කරුවෙකු සහ ට්‍රැක්ටරයක් යොදාගනිමින් වැඩකටයුතු සිදු කරයි. යෙදවූ ප්‍රාග්ධනය එසේම පවතිද්දී වැඩි වැඩියෙන් ශ්‍රමිකයන් යෙදවීමෙන් ඔහුගේ නිමවුමට (මුළු, අයහාර හා සාමාන්‍ය) කුමක් සිදුවේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) වැඩෙන පරිමාණානුකූල ඵල හා හීනවන පරිමාණානුකූල ඵල වලට බලපානු ලබන සාධක මොනවාදැයි ගෙනහැර දක්වන්න.

(ලකුණු 06)

(ඇ) නිෂ්පාදන ප්‍රසාරණ මාර්ගය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

(04) (අ) 'රොබින්' සබන් වෙළඳපොලේ ඇති ආයතන ගණනාවකින් එකක් වන අතර එය දිගුකාලීන සමතුලිතයේ සිටී.

(i) 'රොබින්' හි ලාභ උපරිම කරන නිමවුම සහ මිල පෙන්වන්න.

(ලකුණු 05)

(ii) 'රොබින්' ආයතනයේ ලාභය කුමක්ද? එය කෙටිකාලීන ලාභයෙන් වෙනස්වන්නේ කෙසේද? විස්තර කරන්න.

(ලකුණු 05)

(ආ) පහත දැක්වෙනුයේ ඒකාධිකරුවෙකු මුහුණ දෙන ඉල්ලුම් ශ්‍රිතය හා මුළු පිරිවැය ශ්‍රිතයන් වේ.

$$Q = 400 - 2P$$

$$TC = 35Q + 0.05Q^2$$

(i) ලාභ උපරිම වන මිල හා නිමවුම තීරණය කරන්න.

(ii) ලාභය කොපමණ ද යන්න ගණනය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(05) (අ) භාණ්ඩ ප්‍රභේදනය හා මිල විශේෂිකරණය යන සංකල්පයන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ආ) ව්‍යවර්ථිත ඉල්ලුම් වක්‍ර ආකෘතිය කතිපයාධිකාරී වෙළඳපොළක මිල දැඩියාවකට මගපාදන්නේ කෙසේද?

(ලකුණු 05)

(ඇ) ඒකාධිකාරී තරග වෙළඳපොල ආයතනයකට දිගුකාලීනව අතිප්‍රාමාතික ලාභ ලබන තත්ත්වයක් පවත්වාගෙන යාම අසීරු වී ඇත්තේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) මුළු වෙළඳපොල ඉල්ලුම කාටල සාමාජිකයන් අතර බෙදාහරින්නේ කෙසේදැයි සුදුසු ප්‍රස්ථාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

(06) (අ) ඔබ විසින් පාරිභෝගික භාණ්ඩ විකුණනු ලබන ආයතනයක් පවත්වාගෙන යන්නේ යැයි සිතන්න. රජය විසින් ආදායම් බදු කප්පාදුවක් පිළිබඳව නිවේදනයක් නිකුත් කර ඇත. ඔබගේ විකුණුම් මත මෙයින් සිදුකරනු ලබන බලපෑම කුමක්ද?

(ලකුණු 03)

(ආ) කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත. (සියළු අගයන් රුපියල් මිලියන වලින්)

$$C = 240 + 0.4\, yd$$

$$Tx = 70 + 0.6\, y$$

$$Tr = 250$$

$$I = 160$$

$$G = 320$$

(i) මෙම ආර්ථිකය සඳහා සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 03)

(ii) ගුණකය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ඉහත ආර්ථිකය සඳහා වියදම් ගුණකය ගණනය කරන්න.

(ලකුණු 04)

(iii) පහතින් දැක්වෙන ආන්තික පාරිභෝජන නැඹියා (MPC) අගයන් සඳහා වියදම් ගුණකය ගණනය කරන්න.

a) 0.4 b) 0.75 c) 0.95

(ලකුණු 06)

(ඇ) ආන්තික පාරිභෝජන නැඹියාව සහ ආන්තික ඉතුරුම් නැඹියාව අතර පවතින සම්බන්ධතාවය පහදන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

(07) (අ) මුදලට ඇති ඉල්ලුම පිළිබඳව සාම්ප්‍රදායික හා කේන්සියානු මතවාදයන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ආ) (i) රජය විසින් රාජ්‍ය වියදම් වැඩිකිරීමක්

(ii) යහපත් බැංකු සේවාවක් තුළින් මුදලට ඇති ඉල්ලුමෙහි වැඩිවීමක්

(iii) අධිකාරීත්වය විසින් මූල්‍ය ප්‍රතිපත්තින් ලිහිල් කිරීමක්

සමතුලිත පොලී අනුපාතිකයකට හා සමතුලිත ජාතික ආදායමට සිදුකරනු ලබන බලපෑම විස්තර කරන්න.

(ලකුණු 09)

(ඇ) LM වක්‍රයේ බෑවුම පිස්කල් ප්‍රතිපත්තියෙහි ඵලදායීතාවය තීරණය කිරීම සඳහා බලපාන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

(08) (අ) ව්‍යාපාර කළමනාකරුවෙකුට තීරණ ගැනීමේදී ආර්ථික විද්‍යා අධ්‍යයනය වැදගත් වන්නේ කෙසේද?

(ලකුණු 08)

(ආ) පිරිවැයෙන් තල්ලුවන උද්ධමනය හා ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය අතර පවත්නා වෙනස්කම් පැහැදිලිව ගෙනහැර දක්වන්න.

(ලකුණු 06)

(ඇ) ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියෙහි වර්තමානයෙහි දක්නට ලැබෙන ප්‍රවනතාවයන් මොනවාද?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)